# වෛද්‍ය සංගමයේ නිලවරණයෙන් ජයගත නොහැකි වෛද්‍යවරුන් කිහිප දෙනෙක් විසින් අධිකරණ ක්‍රියාවලිය අනිසි ලෙස යොදා ගැනිම

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වසර 88ක් තිස්සේ වාර්ෂික නිලවරණ පවත්වමින් ඉතාමත්ම ප්‍රජාතන්ත්‍රවාදිව කටයුතු කරන වෘත්තිය සංගමයකි. මෙවර 2014 නිලවරණයේදි තනතුරු 31න් 26 ක් නිතරගයෙන් තේරී පත් වී ඇති අවස්ථාවකදි සෙසු තනතුරු 05 ක් සඳහා පමණක් නාම යෝජනා භාර දිමට වෛද්‍ය නිරෝෂන් ඇතුළු වෛද්‍යවරුන් කණ්ඩායමක් ක්‍රියා කලහ. මින් පෙර වසරක, වෛද්‍ය නිරෝෂන් ප්‍රේමරත්න වෛද්‍ය අනුරුද්ධ පාදෙනියගේ ජන්ද 3077ට එරෙහිව ජන්ද 26ක් ලබා ගනිමින් අන්ත පරාජයකට පත් විය. පරාජය වන බව දැන දැනම නිලවරණයට ඉදිරිපත් වූ ඔහු ඇතුළු පිරිස ජන්දය ජයග්‍රහණය කිරීම බලාපොරොත්තු වූ අයුරින්ම ව්‍යර්ථ වූ අවස්ථාවේදි උසාවි වාරණ නියෝගයක් ලබා ගනිමින් සංගමය අකර්මන්‍ය කිරීමට උත්සාහ කලහ. කොළඹ දිසා අධිකරණයෙන් සහ සිවිල් අභියාචනා මහාධිකරණයෙන් උප සභාපති තනතුරට විරුද්ධව ලබා ගත් වාරණය තිබියදි ගල්කිස්ස දිසා අධිකරණයෙන්ද මුලු නිලවරණයටම වාරණයක් ලබා ගැනිමට ඔවුහු ක්‍රියා කලහ.

මෙය අධිකරණ ක්‍රියාවලිය අනිසි ලෙස යොදා ගැනිමක් බවට ගල්කිස්ස දිසා විනිසුරු ආර්.ඒ.ඩී.ජී.සී රණවක මහතා පැහැදිලි තින්දුවක් ලබා දි ඇත. මෙහිදි උසාවියට කරුණු වසන් කිරීමේ බරපතල චෝදනාවද මෙම වෛද්‍යවරයා ඇතුළු පිරිසට යොමු වී ඇත. තවද, ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධව කටයුතු කල මෙම වෛද්‍යවරු කිහිපදෙනාට අනුග්‍රහය දැක්වූ සංගමයේ භාරකාර මණ්ඩලයේ විශේෂඥ වෛද්‍ය ලලන්ත රණසිංහ සහ විශේෂඥ වෛද්‍ය නිමල් රත්නසේන යන දෙදෙනා විසින් අප සංගමයේ ව්‍යවස්ථාව උල්ලංඝණය කල බවට පැහැදිලිව ප්‍රකාශ කල ගල්කිස්ස දිසා විනිසුරු ආර්.ඒ.ඩී.ජී.සී රණවක මහතා ඔවුන්ට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය නියෝජනය කිරීමට කිසිදු අයිතියක් නොමැති බව පෙන්වා දුන්නේය.

කිහිප දෙනෙකු විසින් අතිමහත් බහුතරය වෛද්‍ය ප්‍රජාවද ඔවුන් නියෝජනය කරන සියයකට ආසන්න ශාඛා සමිතිද, නිලවරණ කමිටුවද, මධ්‍යම කාරක සභාව. නිලවරණයෙන් තේරී පත් වූ විධායක කමිටුවද යන සමස්ත පිරිසට එරෙහිව මෙසේ කටයුතු කිරීම නිසා වෛද්‍යවරුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදි අයිතියට බලවත් අනර්ථයක් සිදු විය. එමෙන්ම වාර්ෂික ස්ථාන මාරු සහ වෙනත් වෘත්තිමය ගැටලු වලදි වෛද්‍යවරුන් හට සෞඛ්‍ය අමාත්‍යාංශය තුල තමන්ව නියෝජනය කරන පිරිස වාරණයට ලක් වීම නිසා ගැටලු රැසක් උද්ගත විය.

මේ සම්බන්ධව ඉතා පැහැදිලි තින්දුවක් ප්‍රකාශයට පත් කල විනිසුරුතුමා සංගමය කෙරෙහි වාරණය පැවැත්වීමෙන් බහුතරයේ අයිතිවාසිකම් උල්ලංඝණය වන බවත් ජන්ද 140 ක් පමණ ලැබීම නිසා පරාජයට පත් වූ වෛද්‍ය නිරෝෂන් මහතාටද මෙම වාරණය ඉවත් කිරීමෙන් කිසිදු පාඩුවක් සිදු නොවන බවත් ප්‍රකාශයට පත් කලේය.

රටේ විවිධාකාර සෞඛ්‍ය ගැටලු නිරාකරණයේදි සහ සෞඛ්‍ය ප්‍රතිපත්තින් සම්පාදනයේදි සාධනීය කාර්‍ය භාරයක් ඉටු කරන රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට එරෙහිව තිබූ වාරණය කිරීම නිසා විද්වත් මතය නියෝජනය නොවීමේ අනිටු ප්‍රතිඵල වලින් මහජනතාව බේරා ගැනිමට හැකි විය.

මේ හරහා ඉදිරියේදි රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයෙන් ඉටු විය යුතු වෛද්‍යවරුන්ගේ සුභ සාධන කටයුතු පවත්වාගෙන යාමටත් විද්වත් වෘත්තිකයන් වශයෙන් සමාජයට ඉටු විය යුතු සමාජිය වගකීම් ඉටු කිරීමටත් වර්තමානයේ දි ඉඩ කඩ සැලසී ඇත.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය